## පොල් සංවර්ධන අධිකාරිය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ගනුදෙනුවල නියැදි පරීක්ෂාවන්හිදී අනාවරණය වූ රු.642,561 ක ගිණුම්කරණ අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. ඒ අනුව ගිණුම්වල එම අඩුපාඩු සම්බන්ධයෙන් ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කරන ලද. එහෙයින් නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරණ අඩුපාඩු නොතිබේය යන්න බැහැර කළ නොහැකි විණි.

#### 1.2.2 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). අධිකාරිය විසින් 2006 වර්ෂයේදී ගොවිජන සමාගමක් වෙත රු. 2,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර ගිවිසම ප්‍රකාරව ණය ප්‍රදානය කළ දින සිට මාස 6 ක් ඇතුළත දී පොලී රහිතව සමාන වාරිකවලින් ගෙවා නිමකළ යුතු වුවත්, අවස්ථා දෙකකදී රු.550,000ක් පමණක් ලැබී තිබුණි.

(ආ). අධිකාරියේ නිලධාරියෙකු අයථා ලෙස පරිහරණය කරන ලද මුදලක් වෙනුවෙන් 1998 වර්ෂයේ සිට අයකරගත යුතුව පවතින පොලිය ඇතුළත් රු 1,664,769 ක් වූ මුදල අයකර ගැනීමට නොහැකිව දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ). සීමාසහිත සමාගමකින් 1985 වර්ෂයේ සිට ලැබිය යුතු රු 26,715,037 ක ණය මුදලෙන් 2008 සිට 2012 වර්ෂ සඳහා අයවිය යුතු රු.මිලියන 20 ක් වූ පොලී මුදල් අයකර ගැනීමට නොහැකිව පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලේ ගිණුම්වල පෙන්වා තිබුණි. ඊට අමතරව පොලී රහිත ණය වශයෙන් 2004 වර්ෂයේ දී රු. මිලියන 31.55ක මුදලක් එම සමාගමට ලබාදී තිබුණ අතර මෙම ණය මුදල්ද අධිකාරියට අය නොවී පැවතුණි.

(ඈ). දිසිදි පොල් මෝල් හිමියනගෙන් අය විය යුතු ගාස්තු සහ නැවුම් පොල් හා කොප්පරා පොල් වෙන්දේසි කටයුතු වෙනුවෙන් අය විය යුතු බිම් කුලී වූ රු. 3,321,715 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඉ). අධිකාරියට අයත් කොටුව ආදිපාද වීදියේ පිහිටි ගොඩනැගිල්ල කුලියට දීමෙන් 2012 වර්ෂය වෙනුවෙන් වැවිලි සංස්ථාවකින් හා වැවිලි සමාගමකින් අයවිය යුතු රු 1,086,667 ක කුලී මුදල 2012 දෙසැම්බර් 30 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඊ). ණය ගැති ශේෂය තුළ වසර තුනකට වඩා පැරණි රු 180,485 ක වටිනාකමට ණයගැති ශේෂ පැවතුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 9.68 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 13.85 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 4.17 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. වර්ෂයේ සමස්ථ වියදම රු.මිලියන 41.92 කින් වැඩි වී තිබුණත් භාණ්ඩාගාර ප්‍රදාන හා අනෙකුත් ආදායම් පිළිවෙලින් රු.මිලියන 39.23 කින් හා රු. මිලියන 6.86 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). අධිකාරියේ මුළු ආදායම්වලින් සියයට 69 ක් භාණ්ඩාගාර ප්‍රදාන වලින්ද, සියයට 12 ක් පොලී ආදායමින්ද, සියයට 16 ක් මෙහෙයුම් ආදායමින්ද, හා සියයට 3ක් විවිධ ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

(ආ). පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් සමාගමක් වෙත ලබාදෙන ලද ණය මුදලට අදාල රු.මිලියන 4 ක් වූ සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ පොලී ආදායම මෙම වසර තුලදීද බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ). අධිකාරියේ මුළු විවිධ ණයගැතියන් වූ රු. මිලියන 35 න් රු.මිලියන 20 ක් එනම් සියයට 57 ක් බොල් ණය වශයෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

(අ). අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද "පෞද්ගලික අංශය හා එක්ව විදේශ වෙළඳපල ප්‍රශස්ථ සොයා බැලීම" ව්‍යාපෘතය සඳහා රු මිලියන 1.6 ක මූල්‍ය ප්‍රතිපාදන වැය කර තිබූ නමුත් 2012 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය අවම මට්ටමක පැවතුණි.

(ආ). සැකසුම් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ව්‍යාපෘති 4 කට අදාල කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ii). ව්‍යාපෘති තුනකට අදාලව භෞතික කාර්යසාධනය ලෙස එකම කාර්යක් වූ "නිපයුම් මධ්‍යස්ථාන සඳහා පෙට්ටි කුට්ටම් පහක් ඇණවුම් කිරීම" යන්න සඳහන් කර තිබුණි.

(iii). "පොල්තෙල්, කොහු හා කොහු ආශ්‍රිත කර්මාන්ත නවීකරණය හා ප්‍රමිතකරණය කිරීම" ව්‍යාපෘතියට අදාලව මූල්‍ය ප්‍රගතියක් සඳහන් නොකර භෞතික කාර්යසාධනය සියයට 56 ක් ලෙස සඳහන් කර තිබුණි.

#### 3.1.2. පාඩු පිට පවත්නා ව්‍යාපෘති

අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන දුන්කන්නාව කොහු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය 2010 , 2011 හා 2012 යන වර්ෂවල පිළිවලින් රු 2,670,717 රු 1,365,368 හා රු 4,683,757 ක් වශයෙන් අලාභ ලබා තිබුණි.

3.1.3. <u>පොල් තෙල් කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2007 වර්ෂයේ පොල් සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කල සමීක්ෂණයකට අනුව පොල්තෙල් නිෂ්පාදන කර්මාන්තයෙහි යෙදෙන පොල් තෙල් මෝල් සංඛ්‍යාව 589 ලෙස හඳුනා ගෙන තිබුණි. නමුත් 2012 වර්ෂය අවසන් වන විට පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂිකව ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන් සංඛ්‍යාව 42 ක් පමණක් වී තිබුණි.

(ආ). ඉහත පරිදි පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන් වාර්ෂිකව අධිකාරියේ ලයාපදිංචි වී, ඔවුන් නිෂ්පාදනය කරණු ලබන පොල්තෙල්වල ගුණත්වය හා ප්‍රමිතිය පරික්ෂා කිරීමක් සිදු නොකරන බැවින් හා ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සියළුම පොල්තෙල්වල ගුණත්වය හා ප්‍රමිතිය පරික්ෂා කිරීම සඳහා පොදු පිළවෙතක් නොමැති බැවින් වෙළඳපොල තුළ ගුණත්වයෙන් හා ප්‍රමිතියෙන් අඩු පොල්තෙල් පැවතිමේ අවදානමක් තිබුණි.

3.2. <u>අක්‍රීය අරමුදල්</u>

අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන දිසිදි පොල් මෝල් සංවර්ධන අරමුදලේ ශේෂය 2011 වර්ෂයේ රු.මිලියන 60 සිට 2012 වර්ෂය අවසානය වන විට රු.මිලියන 73.5 දක්වා වර්ධනය වී තිබුණත්, අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනිම සඳහා තිසි පරිද මෙම මුදල් නොයෙදවීම නිසා අරමුදලේ මුදල් අක්‍රියව පැවතුණි.

3.3. <u>අරමුණට පටහැනි වියදම්</u>

පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන දුන්කන්නාව කොහු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ "කොහු හා කොහු නිම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයන්හි බලශක්ති ඉතිරිකිරීම් ඒකක පිහිටුවීම" ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ කයාකාරි සැළැස්ම මගින් ප්‍රාග්ධන වියදම් යටතේ රු.මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. නමුත් මෙම මුළු මුදලම ව්‍යාපෘතියේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කර තිබුණු බැවින් ක්‍රියාකාරි සැළැස්මේ සඳහන් අරමුණට පටහැනිව ඒවා වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළබඳතත්ත්වය පහත පරිදි වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 7 | 6 | 1 |
| තෘතියික | 9 | 3 | 6 |
| ද්විතියික | 58 | 40 | 18 |
| ප්‍රාථමික | 96 | 72 | 24 |
| **එකතුව** | 170 | 121 | 49 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන තනතුරු 49 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 04 පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). අරමුදල් උපයෝජනය

(ආ). ලැබිය යුතු ගිණුම්

(ඇ). මානව සම්පත් කළමනාකරණය